**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම**

---

**1.0** සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර 2013.05.30 දින සිට ක්‍රියාත්මක වන සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවයේ, ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව **ඒකාබද්ධ රියදුරු සේවයේ III වැනි ශ්‍රේණියේ** තනතුරට බඳවා ගැනීමේ වෘත්තීය පරීක්ෂණය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහිදී අයදුම් කළ හැකි වන්නේ පිරිමි අයදුම්කරුවන්ට පමණි. සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව 03කි.

**2.0** මෙම තනතුර සඳහා නියමිත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් රිය පැදවීම පිළිබඳ වෘත්තීය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඉන් වැඩිම ලකුණු ලබා ගන්නා අය සඳහා පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් පරීක්ෂා කොට ඉන් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත. මෙම වෘත්තීය පරීක්ෂණය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන අතර , එය පැවැත්වෙන දිනය යථා කාලයේදී දන්වනු ඇත.

සටහන :- මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. ඒ සඳහා අමතර ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ. අවශ්‍ය වන සුදුසුකම් නොමැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ.

**3.0** අයදුම් පත්‍ර භාර ගනු ලබන අවසන් දිනය 2026.06.08 දින වේ. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියළු සුදුසුකම් 2026.06.08 වැනි දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**4.0** වැටුප : 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව **ඒකාබද්ධ රියදුරු සේවයේ III වැනි ශ්‍රේණියේ** අදාළ වැටුප් කාණ්ඩය PL 3 - 2025 වන අතර වැටුප් පරිමාණය රු. 42,780- 10×490- 10×540- 10×590- 12x630- රු.66,540/- වේ.

**5.0** මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරු යටත් විය යුතුවේ.

**6.0 බඳවා ගැනීමේ සුදුසුකම් :- සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවයේ III වැනි ශ්‍රේණියේ** තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

**6.1 අධ්‍යාපන සුදුසුකම් :-** අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

**6.2 වෘත්තීය සුදුසුකම්**

i. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වෘත්තීය ප්‍රවීණතා බලපත්‍රය ලබා සිටිය යුතු අතර 2026.06.08 දිනට වසර 03 කට පෙර අවම වශයෙන් සී සහ සී1වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.

**6.3 පළපුරුද්ද**

වාහන රියදුරකු වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

**6.4 කායික සුදුසුකම්**

i. දිවා කාලයේ සහ රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතික මගින් මෙය සනාථ කළ යුතුය.

ii. අවම උස අඩි 5 ක් විය යුතුය.

**6.5 වයස**

2026.06.08 දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.

**07. වෙනත් සුදුසුකම්**

I. සබරගමුව පළාතේ ස්ථිර පදිංචිය සහිත ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

II. අයදුම්කරු, 2026.06.08 දිනට සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, එදිනට පූර්වාසන්න වසර 03ක් තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා 2026.06.08 දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

III. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

සටහන : දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**8.0 විභාග ගාස්තු :**

I. විභාග ගාස්තුව රු. 600/- කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට ( පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. **එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය.** ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතුවේ.

**9.0** අයදුම්පත්‍ර :

9.1 ඒ 4 ( සාමාන්‍ය හාෆ්ෂීට් ) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,
(අ) අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද,
(ආ) අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය.
(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සඳහන් කළ යුතුය.

9.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

9.3 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියළු අයදුම්කරුවන්ට වෘත්තිය පරීක්ෂණයට පෙනී සිටීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9.4 අයදුම් පත්‍රයේද වෘත්තීය පරීක්ෂණය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට අයදුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් හෝ රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවාගත යුතුය.

9.5 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026.06.08 වන දිනට හෝ ඊට පෙර **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

9.6 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවයේ III වැනි ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම "** යන්න හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

**10.0** අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරික්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එසේම මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම මෙම කොමිෂන් සභාව සතුවේ.

**11.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්**

අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**12.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වේනම්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ. සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත. **මෙහි සිංහල හා දෙමළ නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍යය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.**

2026.05.07 දින
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
සබරගමුව පළාත් සභා සංකීර්ණය,
නවනගරය, රත්නපුර.

ඩබ්.ආර්. දිනිෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

**ඩබ්.ආර්. දිනිෂා එස්. රත්නායක**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**සබරගමුව පළාත**

*ආදර්ශ අයදුම් පත්‍රය*

**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරුන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම**

---

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 1
දෙමළ - 2 ☐
ඉංග්‍රීසි - 3
(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1.0 1.1 මුල’කුරු අගට යොදා මුල’කුරු සමඟ නම ..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A.B.C

1.2 සම්පූර්ණ නම ..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම ..........................................
( සිංහලෙන් / දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

1.5 දුරකථන අංකය ☐☐☐☐☐☐☐☐☐☐

1.6 ඉල්ලුම් කරන තනතුර : ..........................................

2.0 2.1 ස්ථිර ලිපිනය ..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................

2.2 ස්ථිර ලිපිනය ..........................................
( සිංහලෙන් / දෙමළෙන්) ..........................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය ..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :..........................................
3.3 ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ..........................................
3.4 පදිංචිව සිටින කාලසීමාව : ..........................................

4.0
4.1 උපන් දිනය: වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

4.2 2026.06.08 වන දිනට වයස: අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

5.0 අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් ඇමිණිය යුතුය.)

වර්ෂය:- .................... විභාග අංකය : .........................

| අනු අංකය | විෂයය | සාමාර්ථය | අනු අංකය | විෂයය | සාමර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

6.0 සේවා අත්දැකීම්:

| සේවය කළ ආයතනය | සේවා කාලය |
|---|---|
| | |

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? ( අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

8.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

8.1 දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ලිපිනය : ................................................................

8.2 දැනට දරන තනතුර : ................................................................

8.3 සේවා කාලය : ................................................................

8.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග : ................................................

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :................................................................

(ii) ලදුපතේ අංකය හා දිනය :................................................................

(iii) ගෙවූ මුදල :................................................................

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)* |
|---|

10.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම අයදුම් පත්‍රයේ ම' විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) ම' විසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

....................................... ......................................

දිනය අයදුම්කරුගේ අත්සන

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන.......................................................... මයා මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු මා ඉදිරිපිට දී ......................... දින ඔහුගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

.......................................... ...................................................

දිනය සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම: ............................................................................

තනතුර: ............................................

ලිපිනය: ............................................

( නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12.0 රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියකු විසින් කළ යුතුය.

(අ) මෙම දෙපාර්තමේන්තුවේ ............................................................................ දින සිට ........................................................................... තනතුරේ සේවය කරන ...................................................................................................මහතා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට උපයාගත යුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(ආ) ඉහත තනතුර සඳහා ඔහු තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් මුදා හැරිය හැකි / නොහැකි බවත් දන්වමි.

.............................................................

දෙපාර්තමේන්තු ආයතන ප්‍රධානියා හෝ බලය පවරනු ලබන නිලධාරියාගේ අත්සන

නම: .....................................................

පදවිය: ..................................................

දිනය.......................................................

දෙපාර්තමේන්තුව/ආයතනය...................

( නිල මුද්‍රාව තබන්න.)